# ප්‍රථම නාවික හමුදා මැරීන් බලසෙණයේ පුහුණුව ලැබූ නාවික පුද්ගලයන් 164 දෙනකු විසිර යති





විජේගුණරත්න මහතාගේ සංකල්පයක් මත ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා නාවික හමුදාවේ පළමු මැරීන් බලසෙණයට අනුයුක්තව පුහුණුව ලැබූ නිලධාරීන් 6 දෙනකු සහ නාවිකයන් 158 දෙනකු සිය පුහුණුව නිමකොට ඊයේ (27 දා) විසිර යන ලදී.

මුල්ලිකුලම් හි පිහිටි, ශ්‍රී ලංකා නාවික නෞකා භරණ ආයතනයේ පැවති එම විසිරයාමේ සහ නිල ලාංඡන පැළඳවීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන්, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සහභාගී විය. ගරුතර මහා සංඝරත්නය, අන්‍යාගමික පූජකවරුන්, අමාත්‍යවරුන්, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්, ප්‍රභූ පුද්ගලයන්, ත්‍රිවිධ හමුදාධිපතිවරුන්, විදේශීය ආරක්ෂක හමුදා ප්‍රධානීන්, ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විසිර යන ලද නාවික පුද්ගලයන්ගේ පවුල් වල සාමාජික සාමාජිකාවන් සහ නාවිකයන් විශාල පිරිසක් ද එම අවස්ථාව සඳහා සහභාගී වී සිටියහ.

ඉතා ආකර්ශනීය සරඹ සංදර්ශනයකින් සහ මැරීන් බලසෙණයේ නාවික පුද්ගලයන්ගේ දක්ෂතා විදහා දැක්වෙන ඉදිරිපත් කිරීමකින් සමන්විත වූ මෙම විසිර යෑමේ පෙළපාලියේදී අදහස් දැක්වූ ජනාධිපතිවරයා ප්‍රකාශ කර සිටියේ වසර දහස් ගණනක ඉතිහාසයක් තිබෙන රටක් වන ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලන කල, කීර්තිමත් හමුදාමය ක්‍රියාකාරකම් පිළිබඳව අප කොතෙකුත් අසා තිබෙන බවත්, එසේම පසුගිය කාලයේ මෙරට පැවති නොසන්සුන් වාතාවරණය හමුවේ ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය මෙන්ම සිවිල් ආරක්ෂක බලකායට අයත් සියලුම රණවිරුවන් සිය ජීවිත පරිත්‍යාගයෙන් තම රාජකාරිය ඉෂ්ඨ කළ බව අප සැවොම දන්නා කාරණයක් බවත්ය.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ මැරීන් බලකාය ස්ථාපිත කිරීමේ ප්‍රභල සන්ධිස්ථානයක් වූයේ 2016 මාර්තු මස 29 වැනි දින ඇමරිකානු නාවික හමුදාවට අයත් 'බ්ලූ රිජ්' යුද නෞකාවේදී ශ්‍රී ලංකා නාවික හමුදාව සහ එක්සත් ජනපද නාවික හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර පැවති මාණ්ඩලික සාකච්ඡාවේදී මැරීන් බලඇණිය පිහිටුවීම සහ එහි පුහුණු කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීමයි. ඒ අනුව වත්මන් නාවික හමුදාධිපතිතුමන්ගේ අදහසකට අනුව ජනාධිපතිතුමන්ගේ ආශිර්වාදයෙන් මෙම මැරීන් බලඇණිය ස්ථාපනය කෙරිණි. එය සුවිශේෂී හැකියාවන්ගෙන් සහ දක්ෂතාවයන්ගෙන් පිරිපුන් ඉතා ශක්තිමත් කණ්ඩායමක් ලෙස එය හැඳින්විය හැක. භූ ජල තරණ ක්‍රියාන්විතයන් සඳහා විශේෂ පුහුණුවක් ලබා ඇති මෙම නාවික පුද්ගලයන් දූපත් රාජ්‍යක් වන අප රටේ ඕනෑම වෙරළ තීරයකට ගොඩබැස සාගරයෙන් පැමිණෙන ඕනෑම සතුරු උවදුරකට විශ්මිත අයුරින් මුහුණ දීමේ නිපුණත්වයකින් යුක්ත වේ.